# මාසික වෙළඳ විවරණිකාව

**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**


**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2022 මැයි**


**04 වෙළුම 05 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ මැයි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,047ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 17.5කින් ඉහළ ගියේය.

2022 වසරේ මැයි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,451ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 9.7කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 12.2කින් සහ සියයට 5.3කින් ඉහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ මැයි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 716ට සාපේක්ෂව, 2022 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 404ක් දක්වා අඩු විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- මැයි)

**අපනයන (එ.ජ. ඩොලර් මිලියන)** **ආනයන (එ.ජ. ඩොලර් මිලියන)**




# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- මැයි)




## අපනයන පරිමා හා මිල දර්ශක (ජන.-මැයි)





2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.


2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 9.4කින් සහ සියයට 2.6කින් ඉහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන


## කෘෂිකාර්මික අපනයන ආදායම





## කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- මැයි)





## තේ සහ රබර් මිල ගණන් *





2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී, තේ, කුළුබඩු, සකස් නොකළ දුම්කොළ සහ එළවළු අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පොල්, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- මැයි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යැම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදිත, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ පිහන් මැටි නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මැයි)





### ආනයන පරිමා හා මිල දර්ශකය (ජන. -මැයි)





ප්‍රධාන වශයෙන්, අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යැම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 12.2කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 19.9කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ මෙවලම්, ගෘහ උපකරණ සහ රබර් නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාර්භෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතට ගැනෙන සීනි හා රසකැවිලි, තෙල් හා මේද වර්ග සහ එළවළු ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- මැයි)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු හා අප්‍රේල් මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග සහ කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ මූල ලෝහ, පොහොර, රසායනික නිෂ්පාදිත සහ රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මැයි)




ප්‍රධාන වශයෙන්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයන පහළ යෑම හේතුවෙන් 2022 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මැයි- 2021 | මැයි- 2022 | වෙනස (%) | ජන. -මැයි 2021 | ජන.-මැයි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **199.3** | **190.9** | **-4.2** | **1,028.7** | **974.5** | **-5.3** |
| එයින් | තේ | 109.2 | 93.7 | -14.2 | 526.6 | 460.9 | -12.5 |
| | පොල් | 34.0 | 36.5 | 7.3 | 157.7 | 175.3 | 11.2 |
| | කුළුබඩු | 25.2 | 21.1 | -16.2 | 161.3 | 127.8 | -20.7 |
| | මුහුදු ආහාර | 15.0 | 16.8 | 11.8 | 90.6 | 105.8 | 16.7 |
| **කාර්මික අපනයන** | | **687.0** | **853.2** | **24.2** | **3,636.4** | **4,270.0** | **17.4** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 372.4 | 483.9 | 29.9 | 2,071.9 | 2,408.5 | 16.2 |
| | රබර් නිෂ්පාදිත | 88.9 | 74.0 | -16.8 | 406.8 | 393.8 | -3.2 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 33.3 | 53.0 | 59.5 | 155.4 | 291.1 | 87.3 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.9 | 42.3 | 8.8 | 206.3 | 222.1 | 7.7 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 40.9 | 46.0 | 12.5 | 196.9 | 220.5 | 12.0 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 16.0 | 38.1 | 138.0 | 111.0 | 157.2 | 41.7 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 2.9 | 5.8 | 99.0 | 17.8 | 30.4 | 70.5 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.5** | **3.2** | **-41.5** | **27.0** | **21.9** | **-18.9** |
| **මුළු අපනයන** | | **891.7** | **1,047.3** | **17.5** | **4,692.0** | **5,266.4** | **12.2** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මැයි- 2021 | මැයි- 2022 | වෙනස (%) | ජන. -මැයි 2021 | ජන.-මැයි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **253.6** | **177.1** | **-30.2** | **1,530.1** | **1,353.7** | **-11.5** |
| **ආහාර හා පාන වර්ග** | | 121.0 | 107.3 | -11.4 | 749.8 | 767.8 | 2.4 |
| එයින් | එළවළු (ආ) | 33.5 | 24.7 | -26.2 | 171.5 | 147.5 | -14.0 |
| | සහල් | 1.1 | 13.7 | 1,140.2 | 5.5 | 154.6 | 2,728.4 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 132.6 | 69.8 | -47.4 | 780.2 | 585.8 | -24.9 |
| එයින් | පෞද්ගලික රථවාහන | 0.5 | 0.7 | 57.0 | 4.0 | 3.4 | -15.7 |
| **අන්තර් භාණ්ඩ** | | **1,045.4** | **1,036.1** | **-0.9** | **5,111.1** | **5,842.7** | **14.3** |
| එයින් | ඉන්ධන | 330.5 | 461.4 | 39.6 | 1,720.9 | 2,383.8 | 38.5 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 235.7 | 243.0 | 3.1 | 1,174.3 | 1,404.7 | 19.6 |
| | පොහොර | 13.0 | 2.4 | -81.5 | 95.2 | 44.5 | -53.3 |
| | තිරිඟු හා ඉරිඟු | 20.8 | 21.4 | 2.9 | 141.0 | 124.1 | -12.0 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **308.4** | **238.3** | **-22.7** | **1,714.3** | **1,605.3** | **-6.4** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 183.2 | 150.1 | -18.1 | 1,096.2 | 1,024.9 | -6.5 |
| **මුළු ආනයන** | | **1,607.4** | **1,451.5** | **-9.7** | **8,355.5** | **8,801.7** | **5.3** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මැයි- 2021 | මැයි- 2022 | වෙනස (%) | ජන. -මැයි 2021 | ජන.-මැයි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -715.7 | -404.1 | | -3,663.5 | -3,535.3 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | මැයි- 2021 | මැයි- 2022 | වෙනස (%) | ජන. -මැයි 2021 | ජන.-මැයි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 124.1 | 145.8 | 17.5 | 130.6 | 146.6 | 12.2 |
| | පරිමා දර්ශකය | 145.0 | 164.8 | 13.7 | 147.2 | 161.0 | 9.4 |
| | මිල දර්ශකය | 85.6 | 88.4 | 3.3 | 88.7 | 91.0 | 2.6 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 143.9 | 129.9 | -9.7 | 149.6 | 157.5 | 5.3 |
| | පරිමා දර්ශකය | 147.1 | 104.8 | -28.8 | 167.5 | 147.1 | -12.2 |
| | මිල දර්ශකය | 97.8 | 124.0 | 26.8 | 89.3 | 107.1 | 19.9 |
| **වෙළඳ මිල අනුපාතය** | | 87.5 | 71.3 | -18.5 | 99.4 | 85.0 | -14.5 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද